අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ අංකය / எனது இல. / My Ref. } ED/16/02/08/01/2024
ඔබේ අංකය / உமது இல. / Your Ref. }
දිනය / திகதி / Date } 2024.08.02

චක්‍රලේඛ අංක : **29/2024**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම පරිවේණාධිපතිවරුන්
සියලුම රජයේ පාසල්වල විදුහල්පතිවරුන්
සියලුම රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්
සියලුම උපකෘත විශේෂ පාසල්වල විදුහල්පතිවරුන්

**සුරක්ෂා සිසු රක්ෂණාවරණය**

සුරක්ෂා සිසු රක්ෂණාවරණයට අදාළ ව 2024.07.01 දින සිට මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන අතර අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 35/2022 හා 2022.10.31 දිනැති චක්‍රලේඛය එදින සිට අවලංගු කෙරේ.

02. දැනුමින් හා කුසලතාවලින් පරිපූර්ණ වූ සිසුන් සමාජගත කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලික පරමාර්ථය වේ. සිසුන්ගේ කායික හා මනෝ සමාජීය යහපැවැත්ම මැනවින් පවත්වාගෙන යාමට අවශ්‍ය ආරක්ෂිත පරිසරයක් ඇති කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. පාසල තුළදී හා ඉන් පිටතදී ඇති විය හැකි රෝග, අනතුරු හා ආබාධ හේතුවෙන් අධ්‍යාපනයට බාධා ඇතිවීම වළක්වාලමින් සිසුන්ගේ අඛණ්ඩ අධ්‍යාපනය තහවුරු කිරීමේ පියවරක් ලෙස සුරක්ෂා සිසු රක්ෂණාවරණය රජයේ අයවැය යෝජනාවකට අනුව 2017 වර්ෂයේදී හඳුන්වා දී ඇත.

03. සුරක්ෂා සිසු රක්ෂණාවරණය 2017.10.01 දින සිට 2022.12.01 දින දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2022.12.02 දින සිට 2024.06.30 දින දක්වා මෙම රක්ෂණාවරණය ක්‍රියාත්මක නොවූ අතර 2024.07.01 දින සිට නැවත වසර 03ක කාලයක් සඳහා ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝප්පරේෂන් ජෙනරල් ලිමිටඩ් ආයතනය සමඟ අධ්‍යාපන අමාත්‍යාංශය ගිවිසුම් ගත වී ඇත.

04. රජයේ පාසල්, රජයේ අනුමත පෞද්ගලික පාසල් සහ පිරිවෙන්හි පළමු ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ඉගෙනුම ලබන වයස අවුරුදු 5 ත් 21 ත් අතර වයස් සීමාවේ පසුවන සිසුන් සහ උපකෘත විශේෂ පාසල්වල ඉගෙනුම ලබන වයස අවුරුදු 4 ත් 21 ත් අතර වයස් සීමාවේ පසු වන සිසුන් සුරක්ෂා සිසු රක්ෂණාවරණයේ ප්‍රතිලාභීහු වෙති.

05. මෙම රක්ෂණාවරණය යටතේ දෙමාපිය මරණ ප්‍රතිලාභය හිමිවනුයේ වාර්ෂික ආදායම රු.180,000/= කට වඩා අඩු ආදායම්ලාභී පවුල් වල සිසුන් සහ "අස්වැසුම" වැඩසටහනට අයත් පවුල් වල සිසුන් සඳහා පමණි.

06. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝප්පරේෂන් ජෙනරල් ලිමිටඩ් ආයතනය විසින් 2024 ජූලි 01 දින සිට 2027 ජුනි 30 දින දක්වා වසර 03ක කාලයක් සඳහා දවසේ පැය 24 ක් හා වර්ෂයේ සියලුම දින ආවරණය වන පරිදි අදාළ රක්ෂණාවරණ පහසුකම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

සුරක්ෂා සිසු රක්ෂණාවරණය යටතේ ලබා දෙනු ලබන ප්‍රතිලාභ පහතින් දැක්වේ.
(උපදෙස් සංග්‍රහයේ දෙවන පරිච්ඡේදයේ සඳහන් අවස්ථා හා ප්‍රතිලාභ)

i. සෞඛ්‍ය රක්ෂණාවරණ
- නේවාසික ප්‍රතිකාර ප්‍රතිලාභ - රු. 300,000 /= (රජයේ / පෞද්ගලික රෝහල්)
- බාහිර ප්‍රතිකාර ප්‍රතිලාභ - රු. 20,000 /=
- අසාධ්‍ය රෝග ප්‍රතිලාභ - රු. 1,500,000/=

ii. අනතුරු රක්ෂණාවරණ
- සදාකාලික පූර්ණ අකර්මණ්‍යතා සඳහා - රු. 200,000/=
- සදාකාලික අර්ධ අකර්මණ්‍යතා සඳහා - රු.150,000/=
- තාවකාලික අකර්මණ්‍යතා සඳහා - රු.25,000 /= සිට රු.100,000/= දක්වා

iii. ජීවිත රක්ෂණාවරණය

වාර්ෂික ආදායම රු.180,000/= කට වඩා අඩු ආදායම්ලාභී පවුල් වල සිසුන්ට අමතරව "අස්වැසුම" වැඩසටහනට අයත් පවුල් වල සිසුන්ගේ මාපිය / නිත්‍යානුකූල භාරකරු වියෝවකදී සිසු දරුවකු සඳහා රු. 75,000/= බැගින් හිමිවේ. එක් මරණයක් වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම මුදල රු. 225,000/= වන අතර පවුලේ සියලුම සිසුන් අතර එම මුදල සමානව වෙන් කෙරේ. මාපියන් දෙදෙනාගේම හෝ නිත්‍යානුකූල භාරකරුගේ මරණ සඳහා වෙන් වෙන් වශයෙන් මෙම රක්ෂණාවරණය හිමිවේ.

07. ඉහත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා හිමිකම් ඉල්ලුම් පත්‍රය (ඇමුණුම 01) සහ හිමිකමට අදාළ සියලුම ලිපි ලේඛන විදුහල්පති විසින් අත්සන තබා සහතික කිරීම අනිවාර්ය වේ.

08. මෙම රක්ෂණාවරණය පිළිබඳ සියලු තොරතුරු හා එක් එක් අධ්‍යාපන ආයතන සතු කාර්යභාරය උපදෙස් මාලාවේ ඇතුළත් කර ඇත.

09. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ආරම්භ කර ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන සුරක්ෂා සිසු රක්ෂණාවරණයට අදාළ ප්‍රතිලාභ, කොන්දේසි හා අපේක්ෂිත කාර්යභාරය පිළිබඳව නිසි පරිදි පාසල් ප්‍රජාව දැනුවත් කිරීමට අධ්‍යාපන බලධාරීන් කටයුතු කළ යුතු ය.

10. නිරෝගී දරු පරපුරක් දැයට දායාද කිරීම හා අධ්‍යාපනික අවස්ථාවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට ඉඩකඩ සැලසීම සඳහා සුරක්ෂා සිසු රක්ෂණාවරණයේ ප්‍රතිලාභ සිසුන්ට හිමිකර දීමට විදුහල්පතිවරුන් ඇතුලු අදාළ සියලුම පාර්ශව විසින් තම උපරිම දායකත්වය ලබා දීමට කටයුතු කල යුතු බව අවධාරණය කරමි.

Jayasundara

ජේ. එම්. තිලකා ජයසුන්දර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**පිටපත් -**

1. ජනාධිපති ලේකම් - කාරුණික දැනගැනීම සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් - කාරුණික දැනගැනීම සඳහා
3. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම සඳහා
4. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම සඳහා
5. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම සඳහා
6. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කාරුණික දැනගැනීම සඳහා

# උපදෙස් මාලාව

## 1 වන පරිච්ඡේදය - සුරක්ෂා සිසු රක්ෂණාවරණය

රක්ෂණාවරණය, රක්ෂණ ආයතනය, ප්‍රතිලාභීන්, ප්‍රතිලාභියකු බවට පත් වීම පිළිබඳ විස්තර මෙම පරිච්ඡේදය තුළ විස්තර කෙරේ.

### 1.1. රක්ෂණාවරණය

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙනු ලබන රක්ෂණාවරණය සුරක්ෂා සිසු රක්ෂණාවරණය ලෙස හැඳින්වේ. 2024 ජූලි 01 දින සිට 2027 ජූනි 30 දින දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ගිවිසුම් ගත වූ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ආයතනය විසින් මෙම සුරක්ෂා සිසු රක්ෂණාවරණය සැපයේ.

### 1.2. ප්‍රතිලාභීන්

සියලුම රජයේ පාසල්, රජයේ අනුමත පෞද්ගලික පාසල් සහ පිරිවෙන් යන විධිමත් සාමාන්‍ය අධ්‍යාපන ආයතනවල ලියාපදිංචි වී අධ්‍යාපන කාර්යයේ නිරත වන පළමු ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ඉගෙනුම ලබන වයස අවුරුදු 5 ත් 21 ත් අතර වයස් සීමාවේ පසුවන සිසුන් සහ උපකෘත විශේෂ පාසල්වල ඉගෙනුම ලබන වයස අවුරුදු 4 ත් 21 ත් අතර වයස් සීමාවේ පසු වන සිසුන් ප්‍රතිලාභීහු වෙති. පාසලෙන් ඉවත් වන සිසුන් ප්‍රතිලාභීන් ලෙස සලකනු නොලැබේ.

මෙම චක්‍රලේඛයේ සහ උපදෙස් සංග්‍රහයෙහි රජයේ පාසල්, රජයේ අනුමත පෞද්ගලික පාසල් සහ උපකෘත විශේෂ පාසල් යනාදිය **'පාසල්'** යන්නෙන් අරුත් ගැන්වෙන අතර මූලික පිරිවෙන්, මහ පිරිවෙන් සහ විද්‍යායතන **'පිරිවෙන්'** යන්නෙන් අරුත් ගැන්වේ. ගිහි, පැවිදි, ශිෂ්‍ය - ශිෂ්‍යාවන් **'සිසුන්'** යන්නෙන් අරුත් ගැන්වේ.

## 2 වන පරිච්ඡේදය - රක්ෂණාවරණ අවස්ථා හා ප්‍රතිලාභ

සෞඛ්‍ය ප්‍රතිලාභ, අනතුරු ප්‍රතිලාභ, මියයාමක දී හිමිවන ප්‍රතිලාභ, විශේෂ ප්‍රතිලාභ අවස්ථා හා මූල්‍ය ප්‍රමාණ පිළිබඳ විස්තර මෙම පරිච්ඡේදයෙහි විස්තර කෙරේ.

### 2.1 සෞඛ්‍ය රක්ෂණාවරණ ප්‍රතිලාභ (වියදම් ප්‍රතිපූරණය කිරීම පමණි)

#### 2.1.1 නේවාසික ප්‍රතිකාර ප්‍රතිලාභ – රු. 300,000/= දක්වා

සියලුම හිමිකම් වර්ෂයට අදාළ හිමිකම් මුදල් ප්‍රමාණයන්ට යටත්ව ගෙවනු ලැබේ.

##### 2.1.1.1 රජයේ රෝහලක ගෙවීම් වාට්ටුවක, පෞද්ගලික ආයුර්වේද රෝහලක හා රජයේ අනුමත පෞද්ගලික රෝහල් සඳහා

a. නේවාසික ප්‍රතිකාර සහ ඖෂධ වියදම් (දිනකට උපරිම කාමර ගාස්තුව රු.12,500/=)

b. වෛද්‍ය ගාස්තු / විශේෂඥ වෛද්‍ය ගාස්තු / ශල්‍ය වෛද්‍ය හා නිර්වින්දන වෛද්‍ය ගාස්තු

c. ශල්‍ය කර්ම වියදම්, වෛද්‍ය පරීක්ෂණ, ඖෂධ සහ බෙහෙත්, සැත්කම් ගාස්තු පරීක්ෂණ, විශේෂඥ වෛද්‍යවරුන් විසින් නිර්දේශ කරන විශේෂ ප්‍රතිකාර

2.1.1.2 **රජයේ රෝහලක, රජයේ ආයුර්වේද රෝහලක නොගෙවන වාට්ටු සඳහා**

a. රජයේ රෝහලක / රජයේ ආයුර්වේද රෝහලක නොගෙවන වාට්ටුවක (Non Paying Ward) එක් රාත්‍රියක් සඳහා රු.1,000/= දෛනික දීමනාව (වසංගත අවස්ථාවක වුවද)

b. නේවාසික ප්‍රතිකාර ලබා ගැනීමේදී පිටතින් ලබා ගත් ඖෂධ, පරීක්ෂණ, Scans, x-ray සඳහා දැරූ වියදම්

2.1.1.3 **අනෙකුත් ප්‍රතිලාභ**

a. රෝහල්ගත වීමකින් තොරව සිදුකරනු ලබන ශල්‍ය කර්ම සඳහා වන වියදම (Endoscopy, Colonoscopy, Sigmoidoscopy හා Bronchoscope සඳහා වන වියදම්ද ඇතුලුව)

b. නිර්දේශිත උපාධ්‍ය හෝ බරපතළ රෝග සඳහා නිර්දේශිත විශේෂ පෝෂණ අතිරේක සඳහා වන වියදම

c. නේවාසිකව ප්‍රතිකාර ලබා රෝහලින් නිදහස්වූ පසු ඖෂධ සඳහා වන වියදම (රෝහලින් නිදහස්වූ දිනයේ සිට සතියක කාලයක් සඳහා)

d. PET scan සඳහා දරනු ලැබූ වියදම

e. වෛද්‍ය නිර්දේශ මත විදේශයකදී සිදු කරන ප්‍රතිකාර

f. Covid – 19 සඳහා වූ ප්‍රතිකාර (පෞද්ගලික රෝහල් සඳහා පමණි)

g. හදිසි අනතුරකින් පසු හෝ හදිසි අනතුරකින් ඇතිවන කැළැල් මත සිදු කරන ප්ලාස්ටික් සැත්කම් සඳහා යන වියදම

2.1.1.4 **රු.75,000/= උපරිම සීමාවක් දක්වා ගෙවනු ලබන අතිරේක ප්‍රතිලාභ**

a. දිගුකාලීන රෝග/ ශල්‍ය කර්ම/ අනතුරුවලදී භාවිත කිරීමට සිදුවන උපකරණ සහ ද්‍රව්‍ය සඳහා වන වියදම (TED/ stockings/ air mattress/ water mattress/ rehabilitation accessories/ special shoes/ walking aids/ crutches/ Wheel chairs)

## 2.1.2 බාහිර ප්‍රතිකාර ප්‍රතිලාභ - රු. 20,000/= දක්වා (වියදම් ප්‍රතිපූරණය කිරීම පමණි)

a. රෝහල් ගතවීමකින් තොරව වුව ද පහත පරීක්ෂණ සඳහා වන වියදම් ප්‍රතිපූරණය කෙරේ. (EEG, MRI, CT Scan, DMSA Scan, DTPA Scan, Ultra Sound Scan, X-Ray)

b. දන්තාබාධ සඳහා ප්‍රතිකාර (දත් පිරවීම හා ගැලවීම සඳහා පමණි) (Filling & Extractions Only)

c. හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන රෝග තත්ත්ව සඳහා ආයුර්වේද ප්‍රතිකාර ලබා ගැනීම (රජයේ අනුමත ආයුර්වේද වෛද්‍ය ශාලා - ඇමුණුම 08).

d. ඇස සහ කන (eye and ear) ආශ්‍රිත ආබාධ නිවැරදි කිරීමේ ප්‍රතිකාර සඳහා

e. ඇස සහ කන ආශ්‍රිත ආබාධ (visual and hearing aids) නිවැරදි කිරීමේ උපාංග සඳහා (මෙය ප්‍රතිපූරණය කිරීමේ පදනම මත ලබා ගත හැකි ප්‍රතිලාභයකි. එසේ වුවද අඩු ආදායම්ලාභීන් සඳහා මෙම පහසුකම සෘජු ගෙවීමේ ක්‍රමය යටතේ ලබා ගත හැකිය - ඇස් කණ්නාඩි සඳහා උපරිම වියදම වසරකට රු. 10,000/= )

f. හදිසි අනතුරකදී ප්‍රතිකාර සඳහා අවශ්‍ය වන Lumber Guards and cervical collars උපාංග සඳහා

## 2.1.3 අසාධ්‍ය රෝග ආවරණ ප්‍රතිලාභ රු. 1,500,000/= දක්වා

දේශීය රෝහලකින් ප්‍රතිකාර ගනු ලබන විට බිල්පත් ප්‍රතිපූරණය කිරීම හෝ සෘජු ගෙවීම් සිදු කරනු ලබන අතර විදේශ රෝහල් ප්‍රතිකාරවල දී ප්‍රතිපූරණය පමණක් සිදු කෙරේ. ප්‍රතිකාර සඳහා විදේශ ගත විය හැක්කේ ශ්‍රී ලංකාව තුළ අදාළ ප්‍රතිකාර නොමැතිවීම සහ කඩිනම් ප්‍රතිකාර අවශ්‍ය නමුත් පොරොත්තු ලේඛනයේ රැඳී සිටීමට සිදුවන අවස්ථාවල දී පමණි (අසාධ්‍ය රෝග සඳහා සෘජු ගෙවීම් ලබා ගත හැකි අනුමත රෝහල් ලේඛනය ඇමුණුම 09 මඟින් දක්වා ඇත).

**2.1.3.1 අසාධ්‍ය/ බරපතළ රෝග ආවරණ අවස්ථා පහත දැක්වේ.**

a. හදවත් සැත්කම් (heart surgery)

b. පිළිකා ප්‍රතිකාර (cancer treatments)

c. වකුගඩු බද්ධ කිරීමේ සැත්කම (kidney transplantation)

d. රුධිර කාන්දුකරණය (dialysis)

e. ඇට මිදුළු බද්ධ කිරීමේ සැත්කම (Bone marrow transplantation)

f. උකුල්, උරහිස් හා දණහිස් සන්ධි ප්‍රතිස්ථාපනය (hip, shoulder, knee joint replacements)

g. මොළයේ සැත්කම් (brain surgery)

h. කොඳුඇට පෙළ විකෘතිවීම නිවැරදි කිරීමේ සැත්කම (scoliosis )

i. කර්ණශංඛ බද්ධ කිරීමේ සැත්කම් / කර්ණශංඛ උපකරණ (cochlear implantation / hearing accessories)

j. කොඳු ඇට පෙළ තෙරපුම සඳහා වූ සැත්කම (spinal cord compression)

k. අක්මාව බද්ධ කිරීමේ සැත්කම් (liver transplantation)

l. අක්ෂි සැත්කම් (eye surgery - හදිසි අනතුරු හේතුවෙන් සැත්කම්, කනීනිකා සැත්කම්, අක්ෂි කාච බද්ධ කිරීම) / tumours / cancers and any other Surgeries

m. කෘත්‍රිම අත් /පාද උපකරණ මිලදී ගැනීම (artificial limbs)

n. තැලසීමියා (thalassemia)

o. මොලේ උණ ( Japanese encephalitis)

## 2.2 හදිසි අනතුරු ප්‍රතිලාභ (වියදම් ප්‍රතිපූරණය කිරීම පමණි)

### 2.2.1 සදාකාලික පූර්ණ / සදාකාලික අර්ධ හා තාවකාලික අකර්මණ්‍යතා ප්‍රතිලාභය (එක් අවස්ථාවක හෝ එක් වර්ෂයක් සඳහා උපරිම මුදල)

**2.2.1.1 සදාකාලික පූර්ණ අකර්මණ්‍යතා සඳහා (Permanent disability) - රු. 200,000/=**

| | | |
|---|---|---|
| a. | ඇස් දෙකෙහිම පෙනීම අහිමි වීම | රු. 200,000/= |
| b. | කන් දෙකෙහිම ඇසීම අහිමි වීම | රු. 200,000/= |
| c. | ගාත්‍රා දෙකක් අහිමි වීම | රු. 200,000/= |
| d. | එක් ඇසක හා එක් ගාත්‍රයක් අහිමි වීම | රු. 200,000/= |
| e. | එක් කනක් හා එක් ගාත්‍රයක් අහිමි වීම | රු. 200,000/= |
| f. | එක් ඇසක පෙනීම හා එක් කනක ඇසීම අහිමි වීම | රු .200,000/= |

#### 2.2.1.2 සදාකාලික අර්ධ අකර්මණ්‍යතා සඳහා (Partial disability) - රු.150,000/=

| | | |
|---|---|---|
| a. | එක් ඇසක් අහිමි වීම | රු. 150,000/= |
| b. | එක් ගාත්‍රයක් අහිමි වීම | රු. 150,000/= |
| c. | එක් කනක ඇසීම අහිමි වීම | රු. 150,000/= |

#### 2.2.1.3 තාවකාලික අකර්මණ්‍යතාව සඳහා - රු .25,000/= සිට රු .100,000/= දක්වා

නිවසේ රැඳී සිටිමින් ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවන කාලය අනුව ගෙවීම් තීරණය වේ. මෙයට අදාළ රජයේ වෛද්‍යවරයාගේ (ආයුර්වේද ප්‍රතිකාර අයත් වේ) නිර්දේශය සහිතව රක්ෂණ ආයතනය විසින් ඉල්ලුම් කරනු ලබන ලියකියවිලි ඉදිරිපත් කල යුතුය. ප්‍රතිකාර ලබන කාලය

| | | |
|---|---|---|
| a. | සති දෙකේ සිට මාස 01 දක්වා | රු. 25,000/= |
| b. | මාස 01 සිට මාස 02 දක්වා | රු. 50,000/= |
| c. | මාස 02කට වැඩි | රු.100,000/= |

## 2.3 ජීවිත රක්ෂණාවරණ ප්‍රතිලාභ

මෙම ප්‍රතිලාභය අඩු අදායම් සහිත පවුල්වල සිසුන් හා "අස්වැසුම" වැඩසටහනට අයත් පවුල් වල සිසුන් සඳහා පමණක් හිමිවේ. ඒ අනුව, පවුලේ වාර්ෂික ආදායම රු 180,000/= නොඉක්මවන බව හෝ "අස්වැසුම" වැඩසටහනට අයත් පවුල් වල සිසුන් බව ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ **ග්‍රාම නිලධාරී සහතිකය** ඉදිරිපත් කළ යුතු ය. (ඇමුණුම 02)

#### 2.3.1 මාපිය / නිත්‍යානුකූල භාරකරු වියෝවකදී එක් ශිෂ්‍යයකු සඳහා රු.75,000/=

වාර්ෂික ආදායම රු 180,000/= නොඉක්මවන අඩු අදායම් සහිත පවුල්වල සිසුන් හා "අස්වැසුම" වැඩසටහනට අයත් පවුල් වල සිසුන්ගේ මාපිය / නිත්‍යානුකූල භාරකරු වියෝවකදී එක් ශිෂ්‍යයකු සඳහා රු.75,000/= බැගින් හිමිවේ. එක් මරණයක් වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම මුදල රු.225,000/= වන අතර පවුලේ සියලුම සිසුන් අතර එම මුදල සමානව වෙන් කෙරේ. මාපියන් දෙදෙනාගේම මරණ සඳහා වෙන් වෙන් වශයෙන් මෙම රක්ෂණාවරණය හිමි වේ.

මාපිය / භාරකරු වියෝවකදී ගෙවීම් සිදු කරන්නේ ශිෂ්‍යයා වෙත පමණි. භාරකරුවන් ලෙස සැලකෙනුයේ දරුවාගේ නිත්‍යානුකූල භාරකාරීත්වය අධිකරණය මඟින් පවරා ඇති පුද්ගලයින් පමණි.

**ශිෂ්‍යයකුගේ මරණය සඳහා ගෙවීම් සිදු නොකෙරේ.**

# 3 වන පරිච්ඡේදය - ප්‍රතිලාභ ලබා ගැනීම

ප්‍රතිලාභ අහිමි වීම, ආවරණය නොවන වියදම්, ප්‍රතිලාභ ලැබීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන, රක්ෂණාවරණ ක්‍රියාවලිය තුළින් ප්‍රතිලාභ නොලබන අවස්ථා, බිල්පත් ප්‍රතිපූරණය කිරීම කළ යුතු ආකාරය මෙම පරිච්ඡේදය තුළ විස්තර කෙරේ.

## 3.1 ප්‍රතිලාභ අහිමි වීම

රජයේ නීති රෙගුලාසි අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී නොමැති පෞද්ගලික රෝහලක හෝ වෛද්‍ය මධ්‍යස්ථානයක ප්‍රතිකාර ලබන අය සඳහා මෙම ප්‍රතිලාභය හිමි නොවේ.

## 3.2 ආවරණය නොවන වියදම්

පහත වියදම් ආවරණය නොවන බව විශේෂ අවධානයට ගත යුතු යි.

a. රෝගය සඳහා වන ප්‍රතිකාරවලට අමතරව සිදුකරන වියදම්. උදා -: දුරකථන බිල්පත්, ආහාර , සේවා ගාස්තු යනාදිය
b. හදිසි අනතුරක දී හැර අනෙක් අවස්ථාවල දී සිදු කරන ප්ලාස්ටික් සැත්කම්/ රූපලාවන්‍ය ප්‍රතිකාර/ තරබාරුව නැති කිරීමට ගන්නා ප්‍රතිකාර ආදී පෙනුම වර්ධනය සඳහා ලබා ගන්නා ප්‍රතිකාර
c. සිය කැමැත්තෙන් සිදු කරගනු ලබන අනතුරු / ආබාධ. උදා -: සියදිවි නසා ගැනීම සඳහා උත්සාහ කිරීම.
d. මද්‍යසාර භාවිත කර ඇති අවස්ථා හෝ වෛද්‍යවරයකු විසින් සහතික නොකරන ලද හෝ උපදෙස් ලබා දී නොමැති ප්‍රතිකාර සඳහා
e. හදිසි අනතුරක දී නොවන අවස්ථාවක සිදුකරන සුන්නත් කිරීම ( circumcision ) සඳහා යන වියදම්
f. වෛද්‍ය අනුමැතියකින් තොරව වන රෝහල් ගතවීම් හා රෝහල් ගතවීමට අදාළ නොවන රෝග සඳහා වන වියදම්
g. කලහකාරී ලෙස හැසිරීම්, උද්ඝෝෂණවල නිරතවීම් අවස්ථාවල දී සිදු වන අනතුරු

## 3.3 ප්‍රතිලාභ ලැබීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන

ප්‍රතිලාභ ලැබීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන පිළිබඳ විස්තරය පහත වගුවෙහි දැක්වේ. එම ලිපි ලේඛන, විදුහල්පති හෝ විදුහල්පති විසින් සුරක්ෂා සිසු රක්ෂණාවරණය විෂය සඳහා බලය පවරන ලද නිලධාරියා විසින් අත්සන, දිනය, නිල මුද්‍රාව තබා සහතික කර දින 90ක් ඇතුළත (රෝහල් ගත වූ දින සිට / මරණය සිදු වූ දින සිට) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ https://www. srilankainsurance.lk/suraksha/ වෙබ් අඩවියට උඩුගත (upload) කළ යුතු වේ. හිමිකම් අයදුම්පත් වෙබ් අඩවිය වෙත ඉදිරිපත් කළ යුතු ආකාරය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ඉදිරිපත් කර ඇති ඇමුණුම 03 හි දැක්වෙන උපදෙස් මාලාවේ අඩංගු වේ.

| අවස්ථාව | ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන |
|---|---|
| නේවාසික ප්‍රතිකාර ආවරණය (රජයේ රෝහල් ගතවීමකදී) | 1. හිමිකම් පත්‍රය<br>2. වෛද්‍යවරයාගේ නිල මුද්‍රව ඇතුළත් රෝග විනිශ්චය කාඩ්පතෙහි සහතික කරන ලද පිටපත<br>3. සිසුවාගේ සායනික වාර්තා පොතෙහි නම වයස හා වෛද්‍යවරයාගේ නිල මුද්‍රව ඇතුළත් මුල් පිටුවෙහි සහතික කරන ලද පිටපත (ඇත්නම්)<br>4. බාහිරෙන් සිදු කරනු ලබන පරීක්ෂණ හා බාහිරෙන් ලබා ගන්නා ඖෂධ සඳහා වෛද්‍යවරයා විසින් අනුමත කළ වට්ටෝරුව (නිල මුද්‍රව සහිතව) සහ මුදල් ගෙවූ බිල්පත් වල මුල් පිටපත්<br>5. සිසුවාගේ මව / පියා/ භාරකරුගේ බැංකු ගිණුම් විස්තර<br>6. සිසුවාගේ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත |

| | |
|---|---|
| නේවාසික ප්‍රතිකාර ආවරණය ( පෞද්ගලික රෝහල් ගතවීමක දී - බිල්පත් ප්‍රතිපූරණය කිරීම පමණි) | 1. හිමිකම් පත්‍රය<br>2. වෛද්‍යවරයාගේ නිල මුද්‍රව ඇතුළත් රෝග විනිශ්චය කාඩ්පතෙහි සහතික කරන ලද පිටපත<br>3. විස්තරාත්මක බිල්පත් වල මුල් පිටපත්<br>4. අත්තිකාරම් ලෙස ගෙවූ මුදලට අදාළ බිල්පත් වල මුල් පිටපත්<br>5. මුදල් ගෙවූ බිල්පත් වල මුල් පිටපත්<br>6. විදේශ ගතව සිදු කරනු ලබන ප්‍රතිකාර සිදු කිරීමට අදාළ වෛද්‍ය නිර්දේශය<br>7. සිසුවාගේ මව / පියා/ භාරකරුගේ බැංකු ගිණුම් විස්තර<br>8. සිසුවාගේ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත |
| බාහිර ප්‍රතිකාර ආවරණය | 1. හිමිකම් පත්‍රය<br>2. පරීක්ෂණ වලට අදාළ වෛද්‍යවරයාගේ නිර්දේශයෙහි සහතික කරන ලද පිටපත (වෛද්‍ය නිල මුද්‍රාව සහිත)<br>3. වෛද්‍ය මධ්‍යස්ථාන හා ඔසුසල් වලින් නිකුත් කරන ලද මුදල් ගෙවූ බිල්පත් වල මුල් පිටපත්<br>4. සිසුවාගේ මව / පියා/ භාරකරුගේ බැංකු ගිණුම් විස්තර<br>5. සිසුවාගේ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත |
| බාහිර ප්‍රතිකාර<br><br>(ඇස් කණ්ණාඩි / ශ්‍රවණ උපකරණ / දන්ත ප්‍රතිකාර) | 1. හිමිකම් පත්‍රය<br>2. ඇස් කණ්ණාඩි මිලදී ගැනීමට අදාළ විශේෂඥ අක්ෂි ශෛල්‍ය වෛද්‍යවරයෙක් විසින් නිකුත් කරන ලද වෛද්‍ය නිර්දේශයේ මුල් පිටපත<br>3. ශ්‍රවණ උපකරණ මිලදී ගැනීමට අදාළ උගුර, කන, නාසය සම්බන්ධ විශේෂඥ ශෛල්‍ය වෛද්‍යවරයෙක් විසින් නිකුත් කරන ලද වෛද්‍ය නිර්දේශයේ මුල් පිටපත<br>4. දන්ත ප්‍රතිකාර වලට අදාළ දන්ත ශෛල්‍ය වෛද්‍යවරයෙක් විසින් නිල මුද්‍රව සහිතව නිකුත් කරන ලද වෛද්‍ය නිර්දේශයේ සහ බිල්පත් වල මුල් පිටපත<br>5. ඇස් කණ්ණාඩි හා ශ්‍රවණ උපකරණ මිලදී ගැනීමට අදාළ මුදල් ගෙවූ බිල්පතෙහි මුල් පිටපත<br>6. අක්ෂි සායන පොතෙහි සහ උගුර, කන, නාසය සායනික පොතෙහි සහතික කරන ලද පිටපතක් (ඇත්නම්)<br>7. සිසුවාගේ මව / පියා/ භාරකරුගේ බැංකු ගිණුම් විස්තර<br>8. සිසුවාගේ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත |
| අසාධ්‍ය රෝග ආවරණය<br><br>සෘජු ගෙවීමකදී | 1. හිමිකම් පත්‍රය<br>2. අත්තිකාරම් ලෙස ගෙවූ මුදලට අදාළ බිල්පත් වල මුල් පිටපත්<br>3. ශෛල්‍යකර්ම හෝ අසාධ්‍ය රෝගය සඳහා වැය වන ඇස්තමේන්තු ගත මුදල පිළිබඳ රෝහල මඟින් නිකුත් කළ ඇස්තමේන්තුවක්<br>4. වෛද්‍යවරයාගේ නිල මුද්‍රව ඇතුළත් රෝග විනිශ්චය කාඩ්පතෙහි සහතික කරන ලද පිටපත |

| | |
|---|---|
| | 5. ලබා ගෙන ඇති ප්‍රතිකාර වලට අදාළ වෙනත් වෛද්‍ය වාර්තා<br>6. සිසුවාගේ මව / පියා/ භාරකරුගේ බැංකු ගිණුම් විස්තර<br>7. සිසුවාගේ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත |
| ප්‍රතිපූරණයකදී | 1. හිමිකම් පත්‍රය<br>2. විස්තරාත්මක බිල්පත්හි මුල් පිටපත්<br>3. අත්තිකාරම් ලෙස ගෙවූ මුදලට අදාළ බිල්පත් වල මුල් පිටපත්<br>4. මුදල් ගෙවූ ලදුපත්හි මුල් පිටපත්<br>5. වෛද්‍යවරයාගේ නිල මුද්‍රව ඇතුළත් රෝග විනිශ්චය කාඩ්පතෙහි සහතික කරන ලද පිටපත<br>6. විදේශ ගතව සිදු කරනු ලබන ප්‍රතිකාර සිදු කිරීමට අදාළ වෛද්‍ය නිර්දේශය<br>7. ලබා ගෙන ඇති වෛද්‍ය ප්‍රතිකාර සඳහා වෛද්‍ය නිර්දේශය<br>8. ලබා ගෙන ඇති ප්‍රතිකාර වලට අදාළ වෙනත් වෛද්‍ය වාර්තා<br>9. සිසුවාගේ මව / පියා/ භාරකරුගේ බැංකු ගිණුම් විස්තර<br>10. සිසුවාගේ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත |
| හදිසි අනතුරු ආවරණය | |
| සදාකාලික පූර්ණ/ අර්ධ අකර්මණ්‍යතාවකදී | 1. හිමිකම් පත්‍රය<br>2. වෛද්‍යවරයාගේ නිල මුද්‍රව ඇතුළත් රෝග විනිශ්චය කාඩ්පතෙහි සහතික කරන ලද පිටපත<br>3. විශේෂඥ වෛද්‍යවරයකු විසින් දුබලතාවය සහ දුබලතාවයේ ප්‍රතිශතය සහතික කරමින් නිකුත් කරනු ලබන වෛද්‍ය වාර්තා<br>4. සිසුවාගේ මව / පියා/ භාරකරුගේ බැංකු ගිණුම් විස්තර<br>5. සිසුවාගේ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත |
| තාවකාලික අකර්මණ්‍යතා | 1. හිමිකම් පත්‍රය<br>2. වෛද්‍යවරයාගේ නිල මුද්‍රව ඇතුළත් රෝග විනිශ්චය කාඩ්පතෙහි සහතික කරන ලද පිටපත<br>3. රෝහල මගින් නිකුත් කරන ලද වෛද්‍ය වාර්තා<br>4. පාසල් නොපැමිණි කාල සීමාව තහවුරු කරමින් විදුහල්පති විසින් නිකුත් කරනු ලබන ලිපිය<br>5. සිසුවාගේ මව / පියා/ භාරකරුගේ බැංකු ගිණුම් විස්තර<br>6. සිසුවාගේ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත |

| | |
|---|---|
| ජීවිත රක්ෂණ ආවරණය<br><br>• දෙමාපිය මරණයක දී | 1. හිමිකම් පත්‍රය<br>2. මරණ සහතිකයේ සහතික කරන ලද පිටපතක්<br>3. කිසියම් නීතිමය තත්වයක් මත මරණ සහතිකය නිකුත් නොකරන අවස්ථාවක තාවකාලික මරණ සහතිකයේ/ පශ්චාත් මරණ පරීක්ෂකගේ / පොලිස් වාර්තාවේ සහතික කරන ලද පිටපත<br>4. මියගිය තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපතක්<br>5. අඩු ආදායම්ලාභියෙකු හෝ "අස්වැසුම" වැඩසටහනට අයත් බවට ප්‍රාදේශීය ලේකම් අනු අත්සන සහිත ග්‍රාම නිලධාරී සහතිකය (මරණ හිමිකම ලබා ගැනීම සඳහා තොරතුරු තහවුරු කිරීම සඳහා - ඇමුණුම 02)<br>6. විවාහ සහතිකයේ සහතික කරන ලද පිටපතක්<br>7. සිසුවාගේ බැංකු පොතෙහි (දරුවාගේ නම, බැංකු ගිණුම් අංකය) සඳහන් මුල් පිටුවේ සහතික කළ පිටපතක්<br>8. සිසුවාගේ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත |
| • නිත්‍යානුකූල භාරකාර මරණයකදී | 1. හිමිකම් පත්‍රය<br>2. මරණ සහතිකයේ සහතික කරන ලද පිටපතක්<br>3. කිසියම් නීතිමය තත්වයක් මත මරණ සහතිකය නිකුත් නොකරන අවස්ථාවක තාවකාලික මරණ සහතිකයේ/ පශ්චාත් මරණ පරීක්ෂකගේ / පොලිස් වාර්තාවේ සහතික කරන ලද පිටපත<br>4. මියගිය තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපතක්<br>5. අඩු ආදායම්ලාභියෙකු හෝ "අස්වැසුම" වැඩසටහනට අයත් බවට ප්‍රාදේශීය ලේකම් අනු අත්සන සහිත ග්‍රාම නිලධාරී සහතිකය (මරණ හිමිකම ලබා ගැනීම සඳහා තොරතුරු තහවුරු කිරීම සඳහා)<br>6. නිත්‍යානුකූල භාරකාරීත්වය තහවුරු කිරීමේ ලිපි ලේඛන<br>7. සිසුවාගේ බැංකු පොතෙහි (දරුවාගේ නම, බැංකු ගිණුම් අංකය) සඳහන් මුල් පිටුවේ සහතික කළ පිටපතක්<br>8. සිසුවාගේ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත |

## 3.4 බිල්පත් පියවීම

### 3.4.1 සෘජු ගෙවීම් පහසුකම් (අසාධ්‍ය රෝග සඳහා පමණි)

අසාධ්‍ය රෝග ආවරණය සඳහා සෘජු හිමිකම් ගෙවීමේ ක්‍රමය - අනුමත දේශීය රෝහල් සඳහා පමණි. **(ඇමුණුම 09)**

සෘජු හිමිකම් ගෙවීමේ ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවීමට විශේෂ හිමිකම් මණ්ඩලයේ පෙර අනුමැතිය ලබා ගත යුතුවේ. ඒ සඳහා සෘජු ක්‍රමය යටතේ ගෙවීම් කිරීමට එකගතාවය පළ කරමින් ගෙවීම් තහවුරු කිරීමේ ලිපි, අදාළ වෛද්‍ය වාර්තා සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසු, රාජකාරී දින වල පෙ.ව.8.30 ත් ප.ව.4.00 කාලය තුළ නිකුත් කරනු ලැබේ.

### 3.4.2 බිල්පත් ප්‍රතිපූරණය කිරීම

හිමිකම් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පතෙහි වර්තමාන තත්ත්වය පිළිබඳව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ https://www.srilankainsurance.lk/suraksha/ වෙබ් අඩවියට ප්‍රවේශ වී ස්වයංව නිරීක්ෂණය කිරීමට හැකියාව පවතී.

ඒ අනුව අඩුපාඩු රහිතව නිවැරදි ලිපි ලේඛන සමඟ ඉදිරිපත් කළ අයදුම්පත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින්,

- භාර ගැනීමේදී ඒ බව සනාථ කිරීම.
- ප්‍රතිලාභ අදාළ බැංකු ගිණුම වෙත බැර කළ පසු ඒ බව සනාථ කිරීම.

සඳහා හිමිකම්ලාභියා විසින් ලබා දෙනු ලබන ජංගම දුරකථන අංකය වෙත කෙටි පනිවිඩ ලැබෙනු ඇත. එබැවින් සෑම අවස්ථාවකදීම නිවැරදි ජංගම දුරකථන අංකයක් ඇතුළත් කිරීම සඳහා හිමිකම් ලාභියා විසින් වග බලා ගත යුතු වේ.

## 3.5 ලිපි ලේඛන භාර දීම

හිමිකම් ලාභියා විසින් හිමිකම් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අදාළ සියලුම ලිපි ලේඛන සහතික කිරීම සඳහා පාසලේ විදුහල්පති වෙත ලබා දිය යුතු වේ. විදුහල්පති විසින් එම ලිපි ලේඛනවල සඳහන් තොරතුරු අපැහැදිළි නොවන සේ සහතික කර නිල මුද්‍රව තැබිය යුතුවේ.

එම ලිපි ලේඛන විදුහල්පති / විදුහල්පති විසින් බලය පවරන ලද සුරක්ෂා සිසු රක්ෂණාවරණය විෂය සම්බන්ධ නිලධාරියා විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ https://www.srilankainsurance.lk/suraksha/ වෙබ් අඩවියේ හිමිකම් ලාභියාගේ තොරතුරු ගොනුවට උඩුගත කිරීම ( Upload ) කළ යුතු වේ. ඉන් අනතුරුව එම සියලුම තොරතුරු හා ලිපි ලේඛන වල සහතික කරන ලද පිටපත් විදුහල්පති භාරයේ තබා ගත යුතු අතර ඇමුණුම 06 මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතුවේ. සහතික කරන ලද ලිපි ලේඛන විදුහල්පති විසින් නැවත දෙමව්පියන් වෙත භාර නොදිය යුතුය.

# 4 වන පරිච්ඡේදය - විවිධ අධ්‍යාපන ආයතනවලින් අපේක්ෂිත කාර්යභාරය

## 4.1. අධ්‍යාපන අමාත්‍යාංශය

a. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා අදාළ අනෙකුත් ආයතන සමඟ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව මගින් සම්බන්ධීකරණය කිරීම.

b. මෙම කාර්යය සම්බන්ධයෙන් හදිසි ඇමතුම් අංකය ස්ථාපිත කිරීම. (හදිසි ඇමතුම් අංකය ලෙස 011 278 7979 භාවිත වන අතර ගැටලු සහගත අවස්ථාවල දී හා තොරතුරු ලබා ගැනීම සඳහා පෙරවරු 8.30 සිට පස්වරු 4.15 කාලය තුළ ඇමතීමේදී තොරතුරු ලබා දීම).

c. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල සහ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල වැඩසටහන භාර නිලධාරීන් දැනුවත් කිරීම.

d. රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධයෙන් පැන නගින ගැටලුවල දී මැදිහත්කරුවකු ලෙස ක්‍රියා කිරීම.

e. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන හිමිකම් අයදුම්පත් පිළිබඳව නැවත පරීක්ෂා කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නිලධාරීන්ගෙන් සමන්විත අභියාචනා මණ්ඩලයක් මාස 03ක ට වරක් කැඳවීම.

## 4.2. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

a. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වැඩසටහන භාර නිලධාරියකු පත් කිරීම.

b. පාසල් ප්‍රජාව සහ මහජනතාව දැනුවත් කිරීමේ කාර්යය ඉටු කිරීම.

c. රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධයෙන් පැන නගින ගැටලුවල දී තම පළාතේ පිහිටි, රක්ෂණ ආයතනයේ ශාඛාවක නියෝජිතයකු සම්බන්ධ කර ගනිමින් ගැටලු නිරාකරණය කර දීමට මැදිහත්කරුවකු ලෙස ක්‍රියා කිරීම.

d. සිසුන්ගේ රක්ෂණ හිමිකම් ඉල්ලුම් කිරීම හා එම හිමිකම් ලැබීම පිළිබඳ තොරතුරු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් ලබා ගෙන තොරතුරු ගොනුවක් පවත්වාගෙන යාම. එම තොරතුරු නිවැරදි තොරතුරු බවට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද සය මාසික වාර්තාව මෘදු පිටපත් වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත අවස්ථා දෙකකදී ලබා දීම. (ඇමුණුම 04)

- 2024.07.01. සිට 2024.12.31 දක්වා 2025.03.15 ට පෙර හා
- 2025.01.01 සිට 2025.06.30 දක්වා 2025.09.15 ට පෙර
  (ඉහත ආකාරයට 2025/2026, 2026/2027 වර්ෂ සඳහාද ලබා දිය යුතු වේ)

## 4.3. කලාප අධ්‍යාපන කාර්යාලය

a. සෑම අධ්‍යාපන කලාපයකම සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන භාර නිලධාරියකු පත් කිරීම හා එම නිලධාරියා විසින් තොරතුරු තාක්ෂණ ඒකකය සමඟ සම්බන්ධ වී සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

b. අධ්‍යාපන කලාපයට අයත් පාසල් ප්‍රජාව සහ මහජනතාව දැනුවත් කිරීමේ කාර්යය ඉටු කිරීම.

c. රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධයෙන් පැන නගින ගැටලුවල දී තම කලාපයේ පිහිටි, රක්ෂණ ආයතනයේ ශාඛාවක නියෝජිතයකු සම්බන්ධකර ගනිමින් ගැටලු නිරාකරණය කර දීමට මැදිහත්කරුවකු ලෙස ක්‍රියා කිරීම.

d. පාසල සතුව හිමිකම් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා හා අදාළ ලිපි ලේඛන උඩුගත කිරීම (upload) සඳහා අවශ්‍ය උපකරණ හා අන්තර්ජාල පහසුකම් නොමැති අවස්ථා වලදී පමණක් එම පාසල් වල විදුහල්පති විසින් ලබා දෙනු ලබන හිමිකම් අයදුම්පත් වලට අදාළ තොරතුරු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ https://www.srilankainsurance.lk/suraksha/ වෙබ් අඩවිය වෙත ඇතුළත් කිරීම හා සහතික කරන ලද පිටපත් උඩුගත කිරීම ( Upload ).

e. සිසුන්ගේ රක්ෂණ හිමිකම් ඉල්ලුම් කිරීම හා එම හිමිකම් ලැබීම පිළිබඳ තොරතුරු පාසල් මඟින් ලබා ගෙන තොරතුරු ගොනුවක් පවත්වාගෙන යාම. එම තොරතුරු නිවැරදි තොරතුරු බවට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද සය මාසික වාර්තාව මෘදු පිටපත් වශයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අවස්ථා දෙකකදී ලබා දීම. (ඇමුණුම 05)

1. 2024.07.01 සිට 2024.12.31 දක්වා 2025.03.01 ට පෙර හා
2. 2025.01.01 සිට 2025.06.30 දින දක්වා 2025.09.01 ට පෙර

(ඉහත ආකාරයට 2025/2026, 2026/2027 වර්ෂ සඳහාද ලබා දිය යුතු වේ)

## 4.4. පාසල / පිරිවෙන

**a.** සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන සම්බන්ධ වගකීම විදුහල්පති / පරිවේණාධිපති විසින් දැරිය යුතු වේ. පාසලේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුව මෙම වැඩසටහන සඳහා වගකීම නියෝජ්‍ය විදුහල්පතිවරයකුට හෝ සහකාර විදුහල්පති වරයකුට ලිඛිතව පැවරීම, එවැනි තනතුරක් සහිත පුද්ගලයන් නොමැති විට ගුරුභවතකුට පැවරීම.

b. රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම පිළිබඳව සිසුන්, දෙමාපියන්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ පාසල් ප්‍රජාව දැනුවත් කිරීම.

c. රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධයෙන් සිසුන්ට ගැටලු සහගත වන අවස්ථාවල දී ඒ සම්බන්ධයෙන් මැදිහත්කරුවකු ලෙස පෙනී සිටීම.

d. ප්‍රමාදයකින් තොරව සිසුන් වෙත ප්‍රතිලාභ ලබා දීම සඳහා නිවැරදි ලේඛන, අඩුපාඩු රහිතව දින 90ක කාල සීමාව තුල ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ https://www.srilankainsurance.lk/suraksha/ වෙබ් අඩවියට උඩුගත කිරීම ( Upload ) සඳහා විදුහල්පති / පරිවේනාධිපති විසින් අවශ්‍ය කටයුතු කිරීම.

e. සුරක්ෂා සිසු රක්ෂණාවරණය මඟින් සැලසෙන ප්‍රතිලාභ හා හිමිකම් අයදුම්පත් ඉදිරිපත් කල යුතු ආකාරය පිළිබඳව විදුහල්පති / පරිවේනාධිපති විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රාදේශීය නියෝජිතයකු සම්බන්ධ කර ගනිමින් දෙමාපිය රැස්වීම් වලදී දෙමාපියන් දැනුවත් කිරීම් සඳහා අනිවාර්යයෙන් කටයුතු කිරීම. ඒ පිළිබඳව ලොග් සටහන් තැබීම හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දැනුවත් කිරීම.

f. තම පාසල සතුව හිමිකම් අයදුම්පත් ඉදිරිපත් කිරීමට හා අදාළ ලිපි ලේඛන උඩුගත කිරීම (upload) සඳහා අවශ්‍ය උපකරණ හා අන්තර්ජාල පහසුකම් නොමැති අවස්ථා වලදී හිමිකම් අයදුම්පත් වලට අදාළ සහතික කරන ලද තොරතුරු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වෙබ් අඩවිය වෙත ඇතුළත් කිරීම සඳහා සහ ලිපි ලේඛන උඩුගත කිරීම ( Upload ) සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දීම.

g. සුරක්ෂා සිසු රක්ෂණාවරණය පිළිබඳ තොරතුරු ඇතුළත් කාඩ්පතක් සියලුම සිසුන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දෙනු ලබන අතර ඒවා සිසුන් වෙත බෙදා දීමට කටයුතු කිරීම (වසර 03 සඳහාම එක් කාඩ්පතක් පමණක් ලබා දෙන අතර එම කාඩ්පතෙහි සිසුවාගේ සම්පූර්ණ නම සඳහන් කර ලබා දීමට කටයුතු කළ යුතුවේ. කාඩ්පතක් අස්ථානගතවූ විට නැවත කාඩ්පතක් නිකුත් කරනු නොලැබේ). (ඇමුණුම 07)

h. තම පාසලේ රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධ තොරතුරු ඇතුළත් ගොනුවක් පවත්වා ගැනීම. එම තොරතුරු නිවැරදි තොරතුරු බවට විදුහල්පති / පරිවේනාධිපති විසින් තහවුරු කරන ලද සය මාසික වාර්තාව මෘදු පිටපත් වශයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අවස්ථා දෙකකදී ලබා දීම. (ඇමුණුම 06)

1. 2024.07.01 සිට 2024.12.31 දක්වා 2025.02.01 ට පෙර හා
2. 2025.01.01 සිට 2025.06.30 දින දක්වා 2025.08.01 ට පෙර

(ඉහත ආකාරයට 2025/2026, 2026/2027 වර්ෂ සඳහාද ලබා දිය යුතු වේ)

# 5 වන පරිච්ඡේදය - නියාමනය හා අධීක්ෂණය හා වාර්තාකරණය

නියාමනයේ දී අපේක්ෂිත කාර්යභාරය, නියාමනය, අධීක්ෂණය හා වාර්තාකරණයට අදාළ ව විවිධ ආයතන ක්‍රියා කළ යුතු ආකාරය, විශේෂ අවධානයට යොමු විය යුතු කරුණු, තොරතුරු ලබා ගැනීම යන විස්තර මෙම පරිච්ඡේදය තුළ අන්තර්ගත වේ.

## 5.1 නියාමනයේ දී අපේක්ෂිත කාර්යභාරය

a. ප්‍රතිලාභ ලබා ගැනීම් පිළිබඳ තොරතුරු පවත්වා ගෙන යාම.
b. රක්ෂණාවරණය ලබා ගැනීමට සහාය වීම හා මඟ පෙන්වීම.

## 5.2 ආයතන ක්‍රියා කළ යුතු ආකාරය

### 5.2.1 ජාතික මට්ටම

වැඩසටහන නියාමනය හා අධීක්ෂණය අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව මෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් ද සිදු කෙරේ. කිසියම් අක්‍රමිකතාවයක් හඳුනාගත හොත් හෝ වංචාවක් සිදුවන බව අනාවරණය වුවහොත් ඒ පිළිබඳව ක්‍රියා කිරීමේ බලය මෙම ආයතන සතු වේ .

### 5.2.2 පළාත් මට්ටම

පළාත් මට්ටමේ නියාමනය, පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා ඔවුන් විසින් බලය පවරන ලද නිලධාරීන් මඟින් සිදු කෙරේ.

### 5.2.3 කලාප මට්ටම

කලාප මට්ටමේ නියාමනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා ඔහු විසින් බලය පවරන ලද නිලධාරීන්, කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මඟින් සිදු කෙරේ.

### 5.2.4 පාසල් / පිරිවෙන් මට්ටම

පාසල් මට්ටමේ නියාමනය විදුහල්පති / පරිවේනාධිපති හා ඔවුන් විසින් බලය පවරන නිලධාරීන් / ගුරුභවතුන් මඟින් සිදු කෙරේ.

## 5.3 විශේෂ අවධානයට යොමු විය යුතු කරුණු

a. ප්‍රතිලාභ ලැබීම සඳහා ඉදිරිපත් කල යුතු ලිපි ලේඛන, විදුහල්පති හෝ විදුහල්පති විසින් සුරක්ෂා සිසු රක්ෂණාවරණය විෂය සඳහා බලය පවරන ලද නිලධාරියා විසින් අත්සන, දිනය නිල මුද්‍රව තබා සහතික කර දින 90ක් ඇතුළත (රෝහල් ගතවූ දින සිට / මරණය සිදුවූ දින සිට) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ https://www.srilankainsurance.lk/ suraksha/ වෙබ් අඩවියට උඩුගත ( Upload ) කළ යුතුවේ.

b. ප්‍රතිලාභයක් ලබා දීමට පෙර අමතර ලිපි ලේඛන ඉල්ලා සිටීමට හෝ අදාළ හිමිකමේ හෝ ඉදිරිපත් කළ ලියවිලිවල නිරවද්‍යතාව තහවුරු කිරීමට අවශ්‍ය විමර්ශන කටයුතු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු වේ.

c. ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන්නේ හිමිකම්පත හා ලිපි ලේඛන වල මුල් පිටපත් හෝ එම ලිපි ලේඛන ඉල්ලා ඇති ආකාරයට උඩුගත (upload) කළ විට පමණි.

d. සාවද්‍ය හිමිකම් ඉල්ලීම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමට හේතු වන අතර අදාළ සිසුන්ගේ සුරක්ෂා සිසු රක්ෂණාවරණය අහෝසි කිරීමට හෝ වෙනත් සුදුසු දඬුවමකට යටත් වීමට හේතුවක් ලෙස සැලකේ. (අසාදුගත රෝහල් ලේඛණය - ඇමුණුම 10)

e. දිගු කාලීන ප්‍රතිකාරවල දී හැර බෙහෙත් වට්ටෝරුව නිකුත් කළ දින සිට දින 07ක් ඇතුළත ඖෂධ හා බෙහෙත් ගැනීම හා පරීක්ෂණ සිදු කළ යුතු වේ.

f. සියලු ප්‍රතිකාර රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් (MBBS හෝ DAMS) හෝ ඊට සමාන හෝ වැඩි සුදුසුකම් සහිත ශල්‍ය වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත යුතු ය.

## 5.4 තොරතුරු ලබා ගැනීම

වැඩි විස්තර පහත වෙබ් අඩවි මගින් ලබා ගත හැකි ය.

- https://www.srilankainsurance.lk/suraksha/
- www.moe.gov.lk

දුරකථන අංක

- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - 0112 - 357 357 (24 පැය ඇමතුම් සේවාව)
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - 0112 - 319 015 (සතියේ දිනවල කාර්යාල වේලාව තුළ පෙ.ව.8.30 - ප.ව.4.45)
- අධ්‍යාපන අමාත්‍යාංශය - 0112 - 787 979 ( සතියේ දිනවල කාර්යාල වේලාව තුළ පෙ .ව.8.30 ප.ව.4.15)